# වානිජමය කටයුතු සඳහා පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරීම

**අවශ්‍ය ලිපි ලේඛණ**

01. සම්පූර්ණ කරන ලද පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර අයදුම්පත්‍රය - (ඇ) ආකෘතිය
02. අයදුම්කරුගේ චරිතය පිළිබඳ වලංගු පොලිස් වාර්තාව - 2 ආකෘතිය (පොලිස් ස්ථානාධිපති නිකුත් කළ දින සිට වසරක් සඳහා වලංගු වේ)
03. ගල් කැඩීම සිදුකරන ඉඩමේ අයිතිය තහවුරු කිරීම පිළිබඳව ග්‍රාම නිලධාරි සමඟ ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව (1 'අ' ආකෘතිය)
04. ගල් පිපිරවීම් / කැණීම් කරන ස්ථානය පිළිබඳ සවිස්තර වාර්තාව (3 ආකෘතිය)
05. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබාගත් වලංගු කැනීම් බලපත්‍රයේ ඡායා පිටපත
06. වලංගු පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ ඡායා පිටපත
07. වලංගු වෙළඳ බලපත්‍රය හෝ මුදල් ගෙවූ රිසිට්පතේ ඡායා පිටපත
08. පසුගිය කැනීම් බලපත්‍රයට අදාලව කඩන ලද බවට ගණනය කරන ලද ගල් කියුබ් සංඛ්‍යාව පිළිබඳ භූ විද්‍යා හා පතල් කාර්යාංශය මඟින් ලබා ගත් වාර්තාව (කළු ගල් සඳහා)
09. ගල්කැඩීම සිදුකරන ඉඩමේ අයිතිය, රාජ්‍ය ආයතනයකට අයත් නම් එම රාජ්‍ය ආයතනය විසින් අයදුම්කරු වෙත කොපමණ ගල් කියුබ් සංඛ්‍යාවක් කඩා ගැනීමට අවසර ලබා දුන්නේද යන්න සඳහන් ලිපිය හෝ ගිවිසුම
10. ගල් කැඩීම සිදුකරන ස්ථානය පිළිබඳව ප්‍රාදේශීය පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂකගේ නිර්දේශය (අදාල නම් පමණි)
11. අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍රයේ මුල් පිටපත හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍රයේ සහතික කළ ඡායා පිටපත

01. දිස්ත්‍රික් ලේකම් නිර්දේශය ලද අයැදුම්පත සහතික කරන ඡායා පිටපත් කට්ටලයක් සමඟ පූර්ව අනුමැතිය සඳහා ආරක්ෂක ලේකම් වෙත යොමු කිරීම
02. ආරක්ෂක ලේකම්ගේ අනුමැතිය ලද පසු පුපුරණ ද්‍රව්‍ය කි.ග්‍රෑම්. ප්‍රමාණයට අනුව අවසරපත්‍රය සඳහා ගාස්තු අය කිරීම
03. පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍රය සකස් කර දිස්ත්‍රික් ලේකම් අත්සනට යොමු කිරීම
04. අයදුම්කරු වෙත පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍රය නිකුත් කිරීම
11. ආරක්ෂක ලේකම්ගේ අනුමැතිය ලද ලේඛන ගොනු ගත කිරීම

## ව්‍යාපෘති සඳහා පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරීම

### අවශ්‍ය ලිපි ලේඛණ

01. සම්පූර්ණ කරන ලද පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර අයදුම්පත්‍රය - (ඇ) ආකෘතිය
02. අයදුම්කරුගේ චරිතය පිළිබඳ වලංගු පොලිස් වාර්තාව - 2 ආකෘතිය (පොලිස් ස්ථානාධිපති නිකුත් කළ දින සිට වසරක් සඳහා වංගුවේ)
03. ගල් කැඩීම සිදුකරන ඉඩමේ අයිතිය තහවුරු කිරීම පිළිබඳව ග්‍රාම නිලධාරි සමඟ ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව (1 'අ' ආකෘතිය)
04. ගල් පිපිරවීම් / කැණීම් කරන ස්ථානය පිළිබඳ සවිස්තර වාර්තාව (3 ආකෘතිය)
05. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබාගත් වලංගු කැනීම් බලපත්‍රයේ හෝ විශේෂ අවසර පත්‍රයේ ඡායා පිටපත
06. කොන්ත්‍රාත්තුව තමා වෙත ලැබී ඇති බව තහවුරු කරන සියළුම ලියකියවිලි වල පිටපත්
07. ව්‍යාපෘතියට අවශ්‍ය පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳ සකස්කළ ඇස්තමේන්තුව ඇතුළත් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරණු ලබන අමාත්‍යාංශ ලේකම්ගේ හෝ ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ නිර්දේශයේ පිටපත
08. අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍රයේ මුල් පිටපත හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍රයේ සහතික කළ ඡායා පිටපත

## වානිජමය නොවන කටයුතු සඳහා පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරීම

**( ගෙපලක් සකස් කිරීම, ළිං කැණීම, වෙනත් සංවර්ධන ක්‍රියාවලියකට අදාල සුළු පරිමාණයේ පිපිරවීම් හා ඉඩමක් වගා කිරීමට සකස් කිරීම ආදිය )**

### අවශ්‍ය ලිපි ලේඛණ

01. සම්පූර්ණ කරන ලද පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර අයදුම්පත්‍රය - (ඇ) ආකෘතිය
02. අයදුම්කරුගේ චරිතය පිළිබඳ වලංගු පොලිස් වාර්තාව - 2 ආකෘතිය (පොලිස් ස්ථානාධිපති නිකුත් කළ දින සිට වසරක් සඳහා වලංගුවේ)
03. ගල් කැඩීම සිදුකරන ඉඩමේ අයිතිය තහවුරු කිරීම පිළිබඳව ග්‍රාම නිලධාරි සමඟ ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව (1 'අ' ආකෘතිය)
04. ගල් පිපිරවීම් / කැණීම් කරන ස්ථානය පිළිබඳ සවිස්තර වාර්තාව (3 ආකෘතිය)

## වානිජමය නොවන කටයුතු සඳහා පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරීම

**( පරීක්ෂණ පිපුරුමක් සඳහා )**

**අවශ්‍ය ලිපි ලේඛණ**

01. සම්පූර්ණ කරන ලද පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර අයදුම්පත්‍රය - (ඇ) ආකෘතිය
02. අයදුම්කරුගේ චරිතය පිළිබඳ වලංගු පොලිස් වාර්තාව - 2 ආකෘතිය (පොලිස් ස්ථානාධිපති නිකුත් කළ දින සිට වසරක් සඳහා වංගුවේ)
03. ගල් පිපිරවීම් / කැණීම් කරන ස්ථානය පිළිබඳ සවිස්තර වාර්තාව (3 ආකෘතිය)
04. පරීක්ෂණ පිපුරුම සම්බන්ධයෙන් භූ විද්‍යා හා පතල් කාර්යාංශයෙන් ලබා දෙන ලිපිය

## ගිනි කෙළි භාණ්ඩ විකිණීම සඳහා පුපුරණ ද්‍රව්‍ය සපයන්නාගේ බලපත්‍රය නිකුත් කිරීම

**අවශ්‍ය ලිපි ලේඛණ**

01. සම්පූර්ණ කරන ලද පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර අයදුම්පත්‍රය - (ඇ) ආකෘතිය
02. අයදුම්කරුගේ චරිතය පිළිබඳ වලංගු පොලිස් වාර්තාව - 2 ආකෘතිය (පොලිස් ස්ථානාධිපති නිකුත් කළ දින සිට වසරක් සඳහා වලංගු වේ)
03. ව්‍යාපාරික ස්ථානය සඳහා පළාත් පාලන ආයතනයෙන් ලබාගත් වෙළඳ බලපත්‍රය හෝ මුදල් ගෙවූ රිසිට් පතේ ඡායාපිටපත
04. අලුත් කිරීමට නම් අයදුම්කරු විසින් ලබාගත් පසුගිය පුපුරන ද්‍රව්‍ය සපයන්නා බලපත්‍රයේ මුල් පිටපත හෝ දැනට වලංගුව පවතින පුපුරන ද්‍රව්‍ය සපයන්නා බලපත්‍රයේ සහතික කළ ඡායා පිටපත

### වගා ආරක්ෂාව / සත්ත්ව පාලනය වෙනුවෙන් නව ගිනිඅවියක් ලබා ගැනීම

**අවශ්‍ය ලිපිලේඛන**

i. සම්පූර්ණ කරන ලද ගිනි අවි / තුවක්කු අයදුම්පත්‍රයේ මුල් පිටපත හා ඡායා පිටපත
ii. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපත් 2 ක්
iii. පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකයේ මුල් පිටපත
iv. කලත්‍රයා සතු ඉඩම් ඉදිරිපත් කරන්නේ නම් විවාහ සහතිකයේ සහතික කළ පිටපත
v. කෘෂිකාර්මික ඉඩම් ඔප්පුවල සහතික කරන ලද ඡායා පිටපත් හා ඊට අදාල පත්ඉරු (අක්කර 02 ට වැඩි විය යුතුය.)
vi. ගිනි අවිය/තුවක්කුව අයදුම් කරන්නේ ;

**ගොවිතැන / වගාව සඳහා නම්**

ඔප්පුවලට අයත් ඉඩම්වල ඇති වගාවන්මොනවාද ? ඒවා කොපමණ ප්‍රමාණයකින් යුක්තද ? එම වගාවන්ට සිදුවන හානි පිළිබඳව කරුණු ඇතුළත් දිස්ත්‍රික් ගොවිජන සේවා සහකාර කොමසාරිස්ගේ වගා හානි පිළිබඳ වාර්තාවේ මුල් පිටපත හා ඡායා පිටපත

**සත්ත්ව පාලනය සඳහා නම්**

සත්ත්ව ගොවිපළ ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපත හා ගොවිපළ සතු සතුන් ප්‍රමාණය හා හානි ඇතුළත් රජයේ පශු වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වාර්තාවේ මුල් පිටපත හා ඡායා පිටපත.

vii. වගා ඉඩම් පිහිටා ඇති ග්‍රාම සේවා වසම් පිළිබඳ ප්‍රාදේශිය ලේකම්ගේ වාර්තාවේ මුල් පිටපත

viii. ප්‍රාදේශිය ලේකම් විසින් නිකුත් කරන ආදායම් සහතිකයේ මුල් පිටපත හෝ ආදායම් බදු ගෙවීම් පිළිබඳ කුවිතාන්සි
(වාර්ෂික ආදායම රු.300,000/= වැඩි විය යුතුය)

**ගිනිඅවි පැවරීම**

**අවශ්‍ය ලිපිලේඛන**

i. සම්පූර්ණ කරන ලද ගිනි අවියක් පැවරීම සඳහා අයදුම්පත්‍රයේ මුල් පිටපත හා ඡායා පිටපත
ii. පැවරුම්ලාභියාගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපත
iii. පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකයේ මුල් පිටපත
iv. පැවරුම්ලාභියාගේ උප්පැන්න සහතිකයේ / විවාහ සහතිකයේ ඡායා පිටපත
v. අවසානවරට ලබාගත් තුවක්කු බලපත්‍රයේ සහතික කරනලද ඡායා පිටපත
vi. පැවරුම්ලාභියා සතු කෘෂිකාර්මික ඉඩම් ඔප්පුවල සහතික කරන ලද ඡායා පිටපත් (අක්කර 02 ට වැඩි විය යුතුය.)
vii. පැවරුම්ලාභියා සතුව ප්‍රමාණාත්මකව කෘෂිකාර්මික ඉඩම් නොමැති නම් පැවරුම්ලාභියාගේ දෙමාපියන්/ කලත්‍රයා සතු වගා ඉඩම්වල පැවරුම්ලාභියා වගා කටයුතු කරන බවට හා එම ඉඩම් අනාගතයේදී පැවරුම්ලාභියාට පවරන බවට දිවුරුම් ප්‍රකාශයක් සමගින් ඊට අදාල ඉඩම් ඔප්පුවල සහතික කරන ලද ඡායාපිටපත්
viii. ඉහත අංක 6 න් ඉදිරිපත් කරන ඔප්පුවලට අයත් ඉඩම්වල ඇති වගාවන් මොනවාද ? ඒවා කොපමණ ප්‍රමාණයකින් යුක්තද ? එම වගාවන්ට සිදුවන හානි පිළිබඳව කරුණු ඇතුළත් දිස්ත්‍රික් ගොවිජන සේවා සහකාර කොමසාරිස්ගේ වාර්තාවේ මුල් පිටපත හා ඡායා පිටපත.
ix. ගිනි අවි හිමිකරු මියගොස් ඇත්නම් ඔහුගේ/ඇයගේ මරණ සහතිකයේ සහතික කරන ලද ඡායාපිටපත
x. පැවරුම්ලාභියා හැර පවුලේ වෙනත් දරුවන් සිටී නම් තුවක්කුව පැවරුම්ලාභියාට ලබාදීම පිළිබඳ ඔවුන්ගේ කැමැත්ත දක්වන දිවුරුම් ප්‍රකාශය
xi. වගා ඉඩම් පිහිටා ඇති ග්‍රාම සේවා වසම් පිළිබඳ ප්‍රාදේශිය ලේකම්ගේ වාර්තාවේ මුල් පිටපත
xii. ප්‍රාදේශිය ලේකම් විසින් නිකුත් කරන ආදායම් සහතිකයේ මුල් පිටපත හෝ ආදායම් බදු ගෙවීම් පිළිබඳ කුවිතාන්සි (වාර්ෂික ආදායම රු.300,000/= වැඩි විය යුතුය)

## වාර්ෂිකව ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම

### අවශ්‍ය ලිපිලේඛන

i. සම්පූර්ණ කරන ලද ගිනි අවි / තුවක්කු බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත්‍රය
ii. වයස අවුරුදු 65-70 අතර පුද්ගලයින්ගේ ගිනි අවි බලපත්‍ර අලුත් කිරීමේදී ගිනි අවියක් භාවිතා කිරීමට සුදුසු කායික හා මානසික තත්වයකින් පසුවන බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකය
iii. වයස අවුරුදු 70 ට වැඩි පුද්ගලයින්ගේ ගිනි අවි මුරකරු අවසර පත්‍රයක් යටතේ භාවිතා කර යුතු නිසා සම්පූර්ණ කරන ලද ගිනි අවි මුරකරු අවසර පත්‍ර අයදුම්පත්‍රය
iv. අවසාන වරට ලබාගත් තුවක්කු බලපත්‍රයේ මුල් පිටපත

## ගිනි අවි බලපත්‍ර අධිකාරිත්වය වෙනස් කිරීම

### අවශ්‍ය ලිපිලේඛන

i. ඉල්ලුම්කරුගේ නව පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය
ii. ගිනි අවි බලපත්‍ර අධිකාරිත්වය මාරු කිරීමට විරෝධතාවක් නොමැති බවට නව පදිංචි දිස්ත්‍රික් ලේකම් වෙතින් ලබා ගත් ලිපිය
iii. ඉල්ලුම්කරු පෙර පදිංචිය හැර ගොස් ඇති බව තහවුරු කරන ග්‍රාම නිලධාරි වෙතින් ලබා ගත් ලිපිය
iv. ගිනි අවි බලපත්‍ර අධිකාරිත්වය මාරු කිරීමට විරෝධතාවක් නොමැති බවට පෙර පදිංචි දිස්ත්‍රික් ලේකම් වෙතින් ලබා ගත් ලිපිය
v. හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපත
vi. අවසන්වරට ලබාගත් තුවක්කු බලපත්‍රයේ සහතික කරනලද ඡායා පිටපත

## භාවිතයට නුසුදුසු ගිනිඅවි රජයට භාරදී නව ගිනිඅවි ලබා ගැනීම

### අවශ්‍ය ලිපිලේඛන

i. ගිනිඅවි හිමිකරුවා විසින් අබලන් තත්වයේ පවතින ගිනි අවිය මාරු කර දෙන මෙන් කරන ලද ඉල්ලීම් ලිපිය
ii. ගිනිඅවිය භාවිතයට ගත නොහැකි අබලන් තත්වයේ පවතින බවට අදාළ පොලිස්ස්ථානාධිපති වෙතින් ලබා ගත් ලිපිය
iii. අබලන් ගිනිඅවිය හා පතරොම් ප්‍රමාණය භාරගත්බවට තහවුරු කරන ලද පොලිස් ස්ථානාධිපති විසින් ලබා ගත් ලිපිය
iv. සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක වෙතින් ලබාගත් ආසන්නතම අවුරුදු 02 ක පතරොම් සම්බන්ධ වැය වාර්තාව

## <u>භාවිතයට නුසුදුසු ගිනි අවි රජයට භාර දී නව ගිනි අවි ලබා ගැනීම</u>

.1 ගිනි අවිය අලුත්වැඩියා කිරීමකින් පසු නැවත භාවිතා කළ නොහැකි තත්වයට අබලන් වී ඇති බවට ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙතින් ලබා ගත් ලිපිය

.2 භාවිතයට නුසුදුසු බව සඳහන් කළ ගිනි අවිය හා පතරොම් ප්‍රමාණය තමා විසින් භාරගෙන ඇති බවට තහවුරු කරන ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙතින් ලබා ගත් ලිපිය

.3 ඉල්ලුම්කරු සතුව කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ සලකා බලා ගිනි අවියේ අවශ්‍යතාවය පිළිබඳව සෑහීමට පත් වන්නේ නම් අබලන් ගිනි අවිය වෙනුවට නව ගිනි අවියක් නිකුත් කිරීමට සුදුසු බවට දිස්ත්‍රික් ලේකම් නිර්දේශිත ලිපිය

.4 සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක වෙතින් ලබාගත් ආසන්නතම අවුරුදු දෙකක පතරොම් සම්බන්ධ වැය වාර්තාව